රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2002

මගේ අංකය :ඒආර්/අයිටි/60
රාජ්‍ය පරිපාලන කලමණාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2002.05.23

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## පරිගණක පුහුණු මධ්‍යස්ථානය/සයිබර් මධ්‍යස්ථානය

රාජ්‍ය සේවකයින් සඳහා වන දුරස්ථ අධ්‍යාපන ව්‍යාපෘතිය විසින් කොළඹ 07, ධර්මපාල මාවතේ අංක 191 හි පිහිටි ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයක්/ සයිබර් මධ්‍යස්ථානයක් විවෘත කර ඇත. මෙම මධ්‍යස්ථානය පෙ.ව. 7.30 සිට ප.ව. 9.00 දක්වා විවෘත ව පවතී.

02. රාජ්‍ය සේවා දුරස්ථ අධ්‍යාපන කාර්යාලය මගින් පිළියෙල කරන ලද අත්පොත් උපයෝගී කර ගනිමින් මෙම මධ්‍යස්ථානය විසින් රාජ්‍ය නිලධාරීන්ට පරිගණක පුහුණුව ලබා දෙනු ලැබේ. මෙයට අමතරව, අන්තර්ජාලය භාවිතා කිරීමට, ඊ-මේල් යැවීමට හෝ පරිගණක වදන් සැකසීමට රජයේ නිලධාරීන්ට දිනපතා පෙ.ව. 7.30 සිට පෙ.ව. 9.00 දක්වාත් ප.ව. 4.00 සිට ප.ව. 9.00 දක්වාත් (ඉරිද සම්පූර්ණ දිනය) මෙම පරිගණක පහසුකම් උපයෝගී කර ගත හැකිය.

නොකඩවා දින තුනක් හෝ සතියකට එක් දිනක් බැගින් සති තුනක කාලයක් පුරා පරිගණක පුහුණුව ලබා ගත හැකිය. පුහුණු පාඨමාලාව අවසානයේදී පුහුණුවන්නන් පරීක්ෂණයකට ලක් කරනු ලබන අතර, සහතික පත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ. කොළඹදී ලබන අත්දැකීම් මත ප්‍රධාන නගරවල මෙබඳු මධ්‍යස්ථාන පිහිටුවනු ඇත.

03. පරිගණක පුහුණු පාඨමාලාව හැදෑරීමට හෝ අන්තර්ජාල පහසුකම් භාවිතා කිරීමට අපේක්ෂා කරන රජයේ නිලධාරීන් බත්තරමුල්ල, පැලවත්ත, ඩී.පී. විජේසිංහ මාවතේ අංක 713 හි රාජ්‍ය සේවා දුරස්ථ අධ්‍යාපන ව්‍යාපෘති කාර්යාලයේ ලියාපදිංචි විය යුතු වේ. ඒ සඳහා ඔවුන් විසින් මේ සමග අමුණා ඇති අයදුම්පත්‍රය අනුව තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන් විසින් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම්කරුට රාජකාරි නිවාඩු ලබා දීමට එකඟ විය යුතුය.

**ඩීටා විමලසිරි**
ලේකම්
රාජ්‍ය පරිපාලන, කලමණාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# අයදුම් පත්‍රය

1. නම :

2. තනතුර : ජා.හැ. අංකය :

3. කාර්යාලීය ලිපිනය :

4. ඉල්ලුම් කරනුයේ

| | ඔව් | නැත |
|---|---|---|
| I. පරිගණක පාඨමාලාව හැදෑරීම සඳහා | ☐ | ☐ |
| II. සයිබර් පහසුකම් ලබාගැනීම සඳහා | ☐ | ☐ |
| III. මෙම කරුණු දෙකම සඳහා | ☐ | ☐ |

දිනය : ඉල්ලුම්කරුගේ අත්සන

5. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ☐ ☐

නිරදේශ කරමි. පරිගණක පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරියා මුදහැරිය හැකිය. ☐ ☐

දිනය : අත්සන :

තනතුර :